
# නුවණැති ඉබ්බා



තවින්සා දසුනි ගුණරත්න

# නුවණැති ඉබ්බා

තවින්සා දසුනි ගුණරත්න

# නුවණැති ඉබ්බා

## තවින්සා දසුනි ගුණරත්න

කතෘ

කතෘගේ වෙනත් කෘති

- බට්ටිච්චිට යාළුවෙක්
- හද කැඩුණු හැටි
- සදුනිගේ කරුණාව

මහ/මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

5 ශ්‍රේණිය

2025 පෙබරවාරි 08

**ISBN : 978-624-208-668-2**

## පිදුම

මාගේ ආදරණීය විදුහල් මෑණියන්,

මහාමායාවට

භක්ති පූර්වකව

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද, සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද, සාහිත්‍යමය වශයෙන් සවර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීම අප ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගෙඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද, ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.


විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# තුති පිදුම

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියේ නිර්මාපක සෙනෙවිරත්න මහලේකම් ගුරු පියාණන්ටත්, පාසල තුල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියමුවානන් වූ මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය ශෂිකලා සේනාධීර මහත්මියටත්, මෙම ග්‍රන්ථය ලිවීම සඳහා මා දිරිමත් කරමින් මා හට මඟ පෙන්වූ සියළුම ගුරු මැණිවරුන්ට සහ පියවරුන්ටත්, ඒ සඳහා උදවු උපකාර කළ අම්මාටත්, අප්පච්චීටත් මාගේ හෘදයංගම ස්තූතිය පුදකරමි.

එකෝමත් එක රටක එක්තරා සණ වනාන්තරයක් තිබුණා. මේ වනාන්තරයේ ගස් වැල්, මල්, දියඇලි, ගංගා වගේම සත්තුත් ජීවත් වුණා.





මේ වනාන්තරයේ එක්තරා ගංගාවක ඉබ්බෝ දෙන්නෙක් ජීවත් වුණා. ඒ ඉබබෝ දෙන්නාගේ නම් තමයි කැරෝල් සහ සිරෝල්.

ඒ අතර මේ වනාන්තරයට අලුතෙන් මුවෙක් ආවා. මේ මුවාගේ නම තමයි පැංචා.





දවසක් පැංචා වතුර බොන්න කියලා ගඟක් ළඟට ආවා. මේ ගඟේ තමයි කැරෝල් සහ සිරෝල් ජීවත් වුනේ.

පැංචා වතුර බොනකොට සිරෝලව දැක්කා. පැංච සිරෝල් සමඟ යාළු වුණා.




පැංචා සිරෝල්ගෙන් "තරඟෙට දුවමුද" කියලා ඇසුවා.

සිරෝල් ඒකට කැමති වුණා. සිරෝල් කිවා "අනිද්දා තරගය පවත්වමු" කියලා. පැංචත් ඒකට කැමති වුණා.



පැංචා ගෙදර ගියාට පස්සේ සිරෝල් ගියා කැරෝල්ව හමු වෙන්න. සිරෝල් මේ හැම විස්තරයක්ම කැරෝල්ට කිවුවා. කැරෝල් සිරෝල්ට කිවුවා පැංචත් එක්ක ඔයාට දුවන්න බෑ කියලා.





එතකොට සිරෝල්ට හොඳ අදහසක් ආවා. එයාට මතක් වුණා "අපි දෙන්නා එක සමානයි" යැයි පැංච දන්නේ නැති බව.


සිරෝල් කැරෝල්ට කිවුවා ඔයා දිනුම් කණුව ළඟ හැංගිලා ඉදලා පැංචා එන විටම එළියට ඇවිත් “මම දිනුවා” යයි කෑගහන්න කියලා.





තරඟ දවස උදාවුණා. පැංචයි සිරෝල්ලුයි තරඟය ආරම්භක ස්ථානයට පැමිණියා. තරඟය ආරම්භ කළා. සිරෝල් ටික දුරක් දිවගොස් හැංගුණා.

පැංචා දිනුම් කණුව වෙතට ආසන්න වෙද්දී ම හැංගී සිටිය කැරොල් “මම දිනුවා” කියාගෙන දිනුම් කණුව ළඟට ආවා. මේ දෙන්නා එක සමාන බව නොදන්නා පැංචා පරාජය පිළිගත්තා.



නුවණැති ඉබ්බා තරඟය ජය ගත්තා.



## පසු වදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත්, අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍යය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යකි. එම බීජ දළු ලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කළාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුවරුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුල විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟබ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්.

978-624-208-668-2